## 2023.01.05 වන දින වරකාපොල ප්‍රාදේශීය සභාවේ හයවන සැසිවාරයේ පනස් අට වන මහා සභා රැස්වීමේ වාර්තාව.

**සහභාගිවූවෝ**

| | |
|---|---|
| 01. එන්. සරත් සුමනසූරිය මැතිතුමා | ගරු සභාපති |
| 02.ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා | ගරු උප සභාපති |
| 03.ආර්.අර්.එම්.පී.රාජකරුණා මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 04.එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05.එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06.එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 07.එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 08.ආර්.ඒ.එන්.උපාලි දයා රත්නායක මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 09.එම්.ආර්.ධර්මකීර්ති ආරියරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 10.කේ.ඒ.එස්.සී.ගුණතිලක මැතිනිය | ගරු මන්ත්‍රී |
| 11.කේ.ඒ.නිරෝෂණි පෙරේරා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 12.ඒ.පී.ධම්මික සුමනසිරි මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 13.එම්.පී.එන්.වර්ණකුල මැතිනිය | ගරු මන්ත්‍රී |
| 14.එච්.ආර්.දයාරත්න වීරසූරිය මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 15.අයි.පී.අජිත් ගුණපාල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 16.පී.ජී.මංජු ශ්‍රී ජයශාන්ත මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 17.එම්.පී.සමීර ප්‍රියසාද් මුතුගල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 18.එම්.පී.සමන්මාලා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 19.ඩබ්.ඒ.මංජුල සරත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 20.ඒ.පී.රුවනි තරංගා විමර්ශනී මැතිනිය | ගරු මන්ත්‍රී |
| 21.එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 22.ඩී.ටී.කරුණාදාස ලෙනගල මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 23.පී.සරත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 24.ඩී.ජයසිංහ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 25.ඩබ්.රවිඳු ප්‍රභාත් සිං ජයරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 26.ආර්.පී.මනෝජ් කුමාර් රාජපක්ෂ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 27.කේ.රංජිත් කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 28.එස්.ආර්.කේ.ලොකු ගලප්පත්ති මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 29.ජී.සනත් සේමසිරි වීරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 30.එල්.ආර්.ප්‍රියදර්ශනී අබේරත්න මැතිනිය | ගරු මන්ත්‍රී |
| 31.එල්.රංගනී ඉන්දු කුමාරි බණ්ඩාර මැතිනිය | ගරු මන්ත්‍රී |
| 32.එච්.එම්.එන්.ජී.යූ.ගයානි හේරත් මැතිනිය | ගරු මන්ත්‍රී |
| 33.ආර්.ඩී.චන්ද්‍රා සෝමලතා මැතිනිය | ගරු මන්ත්‍රී |
| 34.කේ.ටී.ආනන්ද කරුණානායක මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 35.ජී.චන්ද්‍රසිරි මහින්දරත්න මුණසිංහ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 36.ජී.එල්.විජිත ගුණවර්ධන මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 37.ඩබ්.බී.ඩබ්.එම්.ආර්.අයි.ඩී.අළුවිහාරේ මැතිතුමා | ගරු මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන්**

| | |
|---|---|
| 01. ආර්.ඒ.සමන්කුමාරි මිය | ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරී |
| 02. එස්.ඒ මාලනී මිය | විෂය නිළධාරී |

**<u>අ- 01</u>**
**<u>2022.12.08 වන දින මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.</u>**

**<u>සභාගත කිරීම.</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
**2022.12.08** වන දින මහා සභා රැස්වීම් වාර්තාව සභාගත කරනවා. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න අවස්ථාව.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා</u>**
**2022.12.08** වන දින මහා සභා වාර්තාවේ සංශෝධන නොමැති නම් සභා සම්මත කිරීමට අවස්ථාව.

**<u>ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා</u>**
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

***(ඒ අනුව 2022.12.08 වන දින මහා සභා රැස්වීම් වාර්තාව 2023.01.05 වන දින තීරණ අංක අ-01 යටතේ ඒකමතිකව සභා සම්මත විය)***

(ආ) ගරු සභාපතිතුමා විසින් කරන විශේෂ නිවේදන. –

01.

පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණ ලිපියක් තිබෙනවා. ඒ අනුව සභිකයින්ට දීමනා ගෙවීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවපු ලිපියක්.

**<u>සභිකවරුන්ගේ මාසික දීමනාව ගෙවීම් කිරීම සම්බන්ධවයි.</u>**

සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්/
නාගරික කොමසාරිස් ඇතුලු
ප්‍රධාන පරිපාලන නිළධාරීන් වෙත.

පළාත් පාලන ආයතන වල සභිකවරුන්ගේ මාසික දීමනාව ගෙවීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් විගණනය විසින් අනාවරණය කර දෙපාර්තමේන්තුව වෙතද පිළිතුරු අපේක්ෂාවෙන් දැනුම් දී ඇත. එබැවින් ඉදිරියට මාසික දීමනා ගෙවීම කිරීම පහත පරිදි සිදු කල යුතු බව කාරුණිකව දන්වමි.

- සභිකයින්ගේ මාසික දීමනා ගෙවීමේදී 2005.06.08 දිනැති අංක 1396/18 ගැසට් පත්‍රය මඟින් විෂය භාර අමාත්‍යවරයා පනවන රීති අනුව කටයුතු කිරීම.
- සම්පූර්ණ මසක කාලයක් ආවරණ නොවන අවස්ථාවල අදාල වන දින ගණනට අනුපාතිකව ගණනය කර දීමනාව ගෙවීම.

එල්.එම්.පී.ඩබ්.බණ්ඩාර,
පළාත් පාලන කොමසාරිස්,
සබරගමුව පළාත.

මේ එන්නේ ඒ කාරණය නෙවෙයි. ඇත්තටම මේ එන්නේ සභාවල මන්ත්‍රීවරුන්ගේ ධූර කාලය අවසාන වන දිනය තෙක් පමණයි වැටුප ගෙවන්න පුළුවන් කියන කාරණය තමයි මේ කියන්නේ. මට තේරෙන විදිහට නොකියා කියන්නේ ඒක. අපේ සභාවේ විශේෂත්වයක් තිබෙන්නේ, මේ 1396/18 ගැසට් පත්‍රයේ විශේෂයෙන් සඳහන් කරලා තිබෙන්නේ අපට සභික දීමනා ගෙවීමේදී දීමනා ගෙවීමට අදාල මාසයේ පවත්නා මහ සභා රැස්වීම හා කාරක සභා රැස්වීම සඳහා සහභාගී නොවීම. අනිවාර්ය කාරණය තමයි මහ සභාවට සහ කමිටුවකට සහභාගී වීම. නීත්‍යානුකූලව නිවාඩු ලබා ගත්තාට ප්‍රශ්නයක් නැහැ. වෛද්‍ය වාර්තාවක් දීලා සාධාරණ කාරණාවක් මත හෝ සභාව විසින් පනවන ලද විශේෂ කාරණාවක් සඳහා සභාවට සහභාගී නොවීම වැනි කාරණා ටික හැර පැමිණියේ නැතිනම් ගෙවන්න බැහැ. වරකාපොල ප්‍රාදේශීස සභාවේ මහ සභාව පවත්වන්නේ මාසයේ මුල. මාසයේ මුලට ගත්තේ සභිකයින්ගේ සංඛ්‍යාව වැඩි වීමත් සංයුතියේ ප්‍රශ්නයක් වුවහොත් අපට පනතේ කියලා තිබෙනවා එක් ලිත් මාසයකට එක් මාසික සභාවක් වත් පැවැත්විය යුතුයි කියලා. සභාවේ ලේකම්වරයා විසින් සකස් කරන ලද න්‍යාය පත්‍රය තමයි සභාවෙදි අපි සාකච්ඡා කරන්නේ. මහ සභාවක් අවසන් වෙන්න නම් න්‍යාය පත්‍රයේ එකේ සිට අවසානය දක්වාම අවසන් කරන්න ඕනේ. සභාව අඩාලව කල් තියන්නට අවශ්‍ය වුනොත් සභාවක් ඊට දින 14කට පසුව සභාවක් කැඳවන්නට ඕනේනේ. සභාවේ මෙතෙක් කාලයක් ගෙන ආ සම්ප්‍රදායට අනුව මාසික සභාව පැවැත්වුව හොත් අපට සභාවක් කල් තියන්න බැහැ. ඒකයි මම මාසයේ මුල සභාව පවත්වන්නට කටයුතු කලේ. නමුත් අපි පළමුවෙනි මහ සභාවේදී දීමනාව ගෙවනවා. කාරක සභාව පසුගිය මාසයේ කාරක සභාවට. අදාළ මාසයේ කාරක සභාව අදාල වන්නේ ඊළඟ මාසයේ දීමනා ගෙවීමටයි. ඒ නිසා මෙම ලිපියෙන් කියන්නේ මෙම දීමනා ගෙවීම කරන්න එපා කියලා. අපි කමිටු පවත්වන දිනයේදී දීමනාව ගෙවන්නට කටයුතු කරනවා. නැති නම් ප්‍රශ්නයක් වෙනවානේ. ඊට මෙහා දීමනා ගෙවන්න බැහැ. සභාව විසිර හැරිය හොත් 15 වෙනිදා වාගේ දවසක අපට දීමනාවෙන් භාගයක් ගෙවන්න පුළුවන්. සභික දිමනාව ගෙවන්න පුළුවන් මහ සභාවට හා කාරක සභාවට සම්බන්ධ වූවොත් පමණයි. කාරක සභාවට හා මහ සභාවට සම්බන්ධ වුනොත් මාසික දිමනාව ගෙවන්න පුළුවන්. ඊළගට මන්ත්‍රීවරුන්ට තව ප්‍රශ්නයක් තිබෙනවා රජයේ සේවකයින්ගේ රජයට උපයන විට බද්ධක් අය කරනවානේ. දිගින් දිගටම ඒවා ගෙවලා නැහැ. ඒවත් විගණනයේදී ප්‍රශ්න.රජයේ සේවකයෙක් ලෙස වැටුප් ලබන මන්ත්‍රිවරයෙක්ගෙන් වැටුපෙන් 10%ක් ගෙවන්නේ නැහැ කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒක බේරා ගන්න බැහැ. මුහන්දිරම් මන්ත්‍රිතුමා නම් අර්ධ රාජ්‍ය සේවකයෙක්. කියලා මට ලියුමක් දෙනවා කිව්වා. ඊළග පාර මේ අය ලියලා එවනවා. මේවා අන්තිම මොහොතේදි තමයි ලියලා එවන්නේ. ඒ නිසා බොහොම ප්‍රවේශමෙන් මේක බලන්න වෙනවා.

2.

2022 වර්ෂය සඳහා වත්කම් බැරකම් ලබා නොදුන් ගරු මන්ත්‍රිතුමන්ලා

1.ගරු මන්ත්‍රි ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා
2.ගරු මන්ත්‍රි එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා
3. ගරු මන්ත්‍රි එම්.පී.එන්.වර්ණකුල මැතිතුමා
4.ගරු මන්ත්‍රි එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා
5.ගරු මන්ත්‍රි පී.සරත් කුමාර මැතිතුමා
6.ගරු මන්ත්‍රි ඩබ්.රවිඳු ප්‍රභාත් සිං ජයරත්න මැතිතුමා
7.ගරු මන්ත්‍රි ආර්.පී.මනෝජ් කුමාර් රාජපක්ෂ මැතිතුමා
8.ගරු මන්ත්‍රි එල්.රංගනී ඉන්දු කුමාරි බණ්ඩාර මැතිතුමා
9.ගරු මන්ත්‍රි ජී.චන්ද්‍රසිරි මහින්දරත්න මුණසිංහ මැතිතුමා
10.ගරු මන්ත්‍රී එස්.ඒ.ඉනෝකා ශ්‍යාමලි සමරවීර මැතිනිය

පලාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් මේ පිළිබඳව සිහි කැඳවීම් ලිපියක්ද එවලා තිබෙනවා.අපි මේවා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවන්නට ඕනේ. ඒ නිසා මේවා ඉක්මන් කරලා දීලා ඉවර කරන්න.
ඊට අදාළ ලිපිය.

පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත,
සබරගමුව පළාත.

**වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව මාගේ සමාංක හා 2022.05.23 හා 2022.07.07 දිනැති ලිපි හා සම්බන්ධයි.

02. එම ලිපි මඟින් පළාත් පාලන ආයතන වල නියෝජිතයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස දැනුවත් කලද, මේ වන විටත් මෙම දෙපාර්තමේන්තුව වෙත බොහොමයක් පළාත් පාලන ආයතන වලින් එම ප්‍රකාශ ලබාදීමට කටයුතු කර නැති බවට නිරීක්ෂණය විය.

03 මෙම කරුණු සම්බන්ධයෙන් විගණනයෙන්ද නිරන්තරයෙන් විමසීම් කරනු ලබන බැවින් මෙම කාර්ය ඉටුකිරීම නෛතික අවශ්‍යතාවයක් බවද අදාල මහජන නියෝජතයින් වෙත ඉදිරි ආසන්නතම මහා සභාවේදී දැනුවත් කර මුද්‍රා තබන ලද එකී මහජන නියෝජිතයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කඩිනමින් මා වෙත ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි.

එල්.එම්.පී.ඩබ්.බණ්ඩාර,
පළාත් පාලන කොමසාරිස්,
සබරගමුව පළාත.

අද හෙටවත් ඉක්මනට ලියලා ඒ ටික දෙන්න. නැතිනම් ඒක ප්‍රශ්නයක් වෙනවා.

**ඇ)** ප්‍රාදේශීය සභාව අමතා එවන ලද පෙත්සම් හා සංදේශ සභාගත කිරිම -නැත

**(ඈ)** කල් දී ඇති ප්‍රශ්න - නැත

**(ඉ)** කල් දී ඇති යෝජනා

**ඉ- 01**

<u>**පරිසර හා පොදු පහසුකම් කමිටුවේ ගරු සභාපති ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**</u>

<u>**2022.12.20 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කමිටුවෙන් නිර්දේශිත වූ පහත කාරණා මහ සභා අනුමැතියට ඉදිරිපත් කරමි.**</u>

01. මන්ත්‍රීවරුන්ට හිමි විජී පහන් උපකරණ හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

02. සියළුම මන්ත්‍රීවරුන්ට තම බල ප්‍රදේශයේ පොදු සුසාන භූමි ප්‍රදේශවල රෝපණය කිරීම සඳහා අපොන්සු අඹ පැළ පහ බැගින් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

03.වර්තමානය වන විට මාහේන සුසාන භූමිය බොහෝ සෙයින් කැළෑ වැවී ඇති අතර එම සුසාන භූමිය ශුද්ධ කිරීමටත් බැකෝ යන්ත්‍ර යොදා ගනිමින් භූමිය සැකසීමත් සඳහා ශ්‍රමදාන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

<u>**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා**</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>**ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා.**</u>
වර්ෂාව නිසා විජී පහන් විශාල ප්‍රමාණයක් අලුතෙන් සවි කර ගන්න අවශ්‍යයි. ඒවා සවි කරන්න හැකි ඉක්මනින් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම මන්ත්‍රිවරුන් තම බල ප්‍රදේශයේ පොදු සුසාන භූමිවල අඹ පැළ රෝපණය කිරීම වාගේම කොස් පැළ රෝපනය කිරීම යන අදහස තමයි තිබෙන්නේ. මටයි ආනන්ද මන්ත්‍රීතුමාටයි මාහේන සුසාන භූමියට යන්නට සිද්ධ වුණා, ආදාහනයක් සම්බන්ධව. එහිදි අපි දැක්කා ආදාහනාගාරයේ එක කොටසක විතරයි මෘත දේහ ආදාහනය කරන්නේ. ප්‍රතිපාදනයක් යොදවලා ශ්‍රමදානයක් දමලා එය සකස් කර ගැනිමට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.

<u>**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**</u>
ඊට අමතරව මාහේන ආදාහනාගාරයේ පැති බැම්ම පුපුරලා. ඒකට අත ගහන්න විදිහක් නැහැ ලොකු මුදලක් යනවා, ඒක හදන්නට.වෙන එකක් හදන්න ගියොත් ඒක කඩන්න වෙනවානේ. කොයි වෙලාවක හරි ඒක පෙරලෙනවා. ආණ්ඩුකාරතුමාගෙන් වත් සල්ලි ටිකක් ඉල්ලා ගන්න බැලුවා.ඒක දිගටම සකස් කරන්න වෙනවා.

<u>**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා**</u>
මම එක පැත්තකින් රාජකරුණා මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.එක පැත්තකින් කණගාටුව ප්‍රකාශ කරනවා. හේතුව තමයි පසුගිය කාල සීමාවලදී යම් කිසි අරමුදලක් වෙන් කරනවා , අපි ඒක ගන්න සහයෝගය දෙනවා, යෝජනා ස්ථිර කරනවා. නමුත් ඒ ස්ථිර කරනවාත් සමඟම වැඩ පිළිවෙළ එන්නේ තමන්ගේ බල ප්‍රදේශයේ මන්ත්‍රීවරයාට අඹ පැළ තුනක් හෝ පහක් දෙනවා කියන එක.අඩු ආදායම්ලාභීන්ට යම් දෙයක් කරනවා නම් ඒක මන්ත්‍රිවරයාගේ අධීක්ෂණය යටතේ කරන්න ඕනේ. මේ ඔක්කොම දෙන විට කියනවා මන්ත්‍රිවරයාගේ බල ප්‍රදේශය තුළ දෙනවා කියන නිසා තමයි විජී පහන් ටික හරි දෙන නිසා තමයි අපි පූරා අවුරුදු හතරක් විතර සහයෝගයෙන් කටයුතු කරන්නේ. පෙරේදා මම සභාවට ආවා. මට පරිසර කමිටුවේ නිළධාරීතුමිය කියනවා ෂරීප් මන්ත්‍රීතුමා මේකට අත්සන් කරන්න කියලා. මම කිව්වා මේක මගේ අත්සන නෙවෙයි කියලා. බීජ ලබා දිලා තිබෙනවා ගණිතපුර හා වරකාපොල වසමේ. මම හෝ රවිඳු මන්ත්‍රීතුමා හෝ රංජි මන්ත්‍රිතුමා හෝ කවුරුත් අත්සන් කරලා නැහැ. මේක අත්සන් කරලා තිබෙන්නේ වරකාපොල සුපිරිසිදු ව්‍යාපාරිකයන්ගේ සංගමයේ සංජය. එතකොට සංජය කියන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරයෙක් නෙවෙයි. සභාවේ යම් කිසි මුදලක් අපි වෙන් කරලා සභාපතිතුමාගේ අත්සන තිබුණා නම් හරි ඒකේ ප්‍රශ්නයක් නැහැ. සභාවේ ප්‍රධානියා සභාපතිතුමා. මේ වෙළඳ ව්‍යාපාරිකයා තමයි අත්සන් කරලා තිබෙන්නේ මේ බීජ ටික දෙන්නට. එයා ඥාතීන්ට දුන්නද වෙන කාට හරි දුන්නද කියලා දන්නේ නැහැ. මේ ක්‍රමවේදය වැරදියි. සභාවට අපි එන්න ඕනේ අත උස්සන්න ඕනේ යෝජනා සම්මත කර ගන්න ඕනේ. සම්බන්ධයක් නැති මන්ත්‍රිවරයෙක් අත්සන් කරලා ව්‍යාපාරිකයෙකුට බීජ ටික දීලා. අපි දන්නේ නැහැනේ මේ සම්බන්ධකම. මම කියන්නේ විජී පහන් ටික ගත්තත් අඩුම තරමේ මට මතක තිබෙනවා සුළු නගර සභා කාලයේදී රොබට් මහත්තයා හිටියා ස්වාධීනව සම සමාජ පක්ෂයේ සභාපතිවරයා වශයෙන්. නමුත් මගේ තාත්තා අංක එකේ නියෝජිතයා. නමුත් උත්සව පවත්වාගෙන යන කොට මගේ තාත්තා ගෙනත්ලා ස්තුති කළා. ප්‍රධානියාටත් ආඩම්බරයක්. අපේ ප්‍රධානියා ඔබතුමා. මගේ කොට්ඨාසය උනත් මම ඔබතුමා ගෙන්නලා තමයි වැඩ කටයුතු කරන්නේ මගේ සභාපතිතුමා අපේ සභාව. නමුත් මේ සිද්ධාන්තය අපි මේකේ ලක්ෂ විස්සකට තිහකට අත ඉස්සුවත් ක්‍රමවේදය වෙනයි, බෙදීමේදී වෙනයි. නමුත් එකක් මතක තියා ගන්න ඕනේ සභාපතිතුමනි, ඔබතුමා නොමඟ යවනවද දන්නෙත් නැහැ නිළධාරීන්. සභාවේ තිබෙන පොදු දේපළ හෝ පොදු මුදල වෙනත් කරුණු සම්බන්ධව මැතිවරණයකට හෝ

දේශපාලන පුද්ගලයෙකුට හරි දෙන එක සම්පූර්ණයෙන් වැරදියි. සභාපතිතුමාගේ අත්සනත් නැහැ, මගේ අත්සනත් නැහැ. සංජය අත්සන් කරලා අරගෙන දීලා. කොවිඩ් ආවා කියලා සභාවේ අරමුදල් අවභාවිතා කරන්න බැහැ. සභාපතිතුමා තමයි හිර වෙන්නේ. නිළධාරී මේක දැනගෙන කරනවාද? රවිඳු මන්ත්‍රීතුමා හරි අත්සන් කරලා තිබුණා නම් මම පිළිගන්නවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

මම ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වනවා. දිගින් දිගටම විවාද කිරීම තුල ඇති වන්නේ ප්‍රශ්නයක් විතරයි.මම මේ සභාව අවුරුදු පහක් තිස්සේ දුවනවා. මම මේ පිළිබඳව සාවධානව අසාගෙන හිටියා. පහු වෙනකොට කොහු වෙනවා ඒක තමයි මේ තත්වය. මේක මහ සභාවේ කතා කරන්නේ නැතුව, ඊයේ මම සභාවේ හිටියනේ. විපක්ෂ නායකතුමා මේක අත්සන් නොකර ඔබතුමා මට ඇවිල්ලා කතා කරලා මට කීවා නම් මේක මට නිවැරදි කරන්න තිබුණනේ.කුමාර මන්ත්‍රීතුමා අඩුපාඩු මට කියනවා. අපි ඒවා නිවැරදි කර ගන්නවා. මම නොවෙයිනේ කරන්නේ නිළධාරීන්ගේ අඩුපාඩු තිබෙනවා. මන්ත්‍රීවරයෙක් නොවන පුද්ගලයෙකුට බීජ දුන්නා නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒක කොට්ඨාසයේ මන්ත්‍රීවරයෙකුට දුන්නා නම් හරි. ඒක දීලා තිබෙනවා නම් මන්ත්‍රිවරයෙකු නොවන අයෙකුට ඒක සම්පූර්ණයෙන්ම වැරදියි.මම කියන්නේ මේ සභාවේ කතා නොකර මට මේක නිවැරදි කර ගන්න තිබුණා ඊයේ මේක කතා කරා නම් කියලා මම කියන්නේ. දැන් මම මේක නිවැරදි කරනවා හරිනේ. ඒ වරද පෙන්වා දීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා. මම සතුටු වෙනවා .වරද නිවැරදි කිරීමට මම කටයුතු කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී. මුහන්දිරම් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, පරිසර කමිටුවේ යෝජනාව පිළිබඳව වචනයක් කතා කරන්න ඕනේ. මේක අපේ අවසාන සභා වාරයද දන්නෙත් නැහැ. ඒ කෙසේ වෙතත් කළගුණ සළකන්න ඕනේ. දවසක් පරිසර කමිටුවේ සභාපතිවරයාට විරුද්ධව අදහස් ප්‍රකාශ කළා. මම අරගලයක් කළා. ලක්ෂ හතරක් පහක් වියදම් කලා තුංතොට තෙලි ඇල්ල ප්‍රදේශයේ මිනිස්සු නඩු හබ වලට පැටලුණා. නමුත් අවසානයේ මමත් ගොඩක් සතුටු වෙනවා පසුගිය 24 වෙනිදා ඔබතුමත් ගෙන්නලා උප සභාපතිතුමාගේ කොට්ඨාසයේ එතුමට හදිසි වැඩක් නිසා පැමිණීමට නොහැකි වුණා.පරිසර කමිටුවේ සභාපතිතුමා සම්බන්ධ වුණා. තෙලි ඇල්ලේ මහ මෙවුනා ආරාමයත්, තෙලි ඇල්ල සුරැකීමේ සංවිධානයත් ගමේ මිනිස්සුත් එකතු වෙලා ඔබතුමාට තේ ටිකක් දීලා උපහාර උත්සවයක් කළා. මේ පහසු කාරණාවක් අමාරුවේ දාලා මිනිස්සුන්ට ගැටුම් රාශියක් නිර්මාණය කරලා තෙලි ඇල්ල ජල පෝෂිතයක් වූ, ගුරුගොඩ ඔය, රක්ෂිතය, කොටියාකුඹුර ජල මූලාශය. විශේෂයෙන් මුස්ලිම් ජනතාව හාරදහසක් පන්දහසක් ජලය පාරිභෝජනය කරන ජල ව්‍යාපෘතිය මේ සියල්ල ඉතාමත් සාමකාමීව රැක ගන්නට පුළුවන් වුණා අධිකරණමය කටයුත්ත කෙසේ වෙතත් පළමු පුරවැසියා ලෙස ඔබතුමා දක්වපු උනන්දුව සහ කැපවීම නිසා එදා උපහාරයට ලක් වුණා. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මමත් මෙයට සම්බන්ධ වීම සහ මෙයට මැදිහත් වීම පිළිබඳව මටත් සතුටක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ ජනතාව තමුන්නාන්සේට කරපු උපහාරය පිළිබඳව. ඒ නිසා මම විශේෂයෙන් රාජකරුණා මන්ත්‍රීතුමාටත් ස්තූතිවන්ත වෙනවා. කුණු දමන විටත් එතුමා පරිසර කමිටුවේ හිටියා කුණු නවත්තන විටත් එතුමා සභාවේ හිටියා කියලා එතුමාගේ කතාවේදී එදා කිව්වා. යුග දෙකක එතුමට පවක් කරලා පිනක් කර ගන්නට ලැබුණා. ඒ නිසා මම ඒ ගැනත් සතුටු වෙනවා.මම මන්ත්‍රිවරයෙක් ලෙස ඡන්දය ඉල්ලන්න ආව ප්‍රධාන කාරණාව තෙලි ඇල්ලේ කුණු ප්‍රශ්නය. ඊට පස්සේ යටිතල පහසුකම් ගමේ තිබෙන්නට ඇති නමුත් ඒ පිළිබඳව එකට තියලා කටයුතු කළේ මම. මම සතුටු වෙනවා මේ සැසිවාරය තුළ යම් යම් ආදායම් මාර්ග හදා ගෙන තිබුණ සභාපතිවරු මේ ප්‍රාදේශීය සභාවේ හිටියා. විපක්ෂනායකතුමා කියනවා වාගේ ඒ අය පසුගිය කාලේ අපි අත ඉස්සුවා ලක්ෂ දාහතරයි, ලක්ෂ දොළහයි, ලක්ෂ අටයි කුණු තල්ලු කරන්නට. නමුත් අද තමුන්නාන්සේලාගේ වීථි ලාම්පුවක් හැදෙන්නට පොත් ටිකක් දෙන්නට, එසේ නැතිනම් පාරක් හදන්නට ඒ සල්ලි පක්ෂ විපක්ෂ භේදයක් නැතුව යොමු වෙනවා. හැබැයි එදා ඔබතුමා කිව්වා වාගේ එදා ඇටේට අත ඉස්සුවා වාගේ අද ඇට ගොඩකට අත ඉස්සුවා. ඒවා ලක්ෂ ගණන් තිබුණේ. ඒ නිසා මං හිතනවා ආයතනික අවශ්‍යතාවය ප්‍රදේශයේ ජනතාවගේ පැත්තක්ම පණ නැතිකරලා වරකාපොල තිබුන කුණු ගඳ මැස්සෝ ටික බෝ වෙලා ඉන්නවා වත් දැක්කේ නැහැ. අඩුම තරමේ තේ මේසේ වත් මැස්සෝ හිටියේ නැහැ. පාරිසරිකව රැකගත යුතු ප්‍රදේශයක් නමුත් අවාසනාවකට පසුගිය කාලයේ ඒක සිද්ධ වුනේ නැහැ. ඒ විදිහටම දේශපාලන ප්‍රතිලාභත් ඒ ජනතාවගෙන් නායකයින්ට ලැබෙනවා. ඒක හොඳට මතක තියා ගන්න.ගොනා ගැට ගහපු විට කරත්තය එනවා වාගේ පස්සෙන් ඒ නායකයෝ කරන ඒවත් ඒ විදිහටම වෙනවා. ඒ නිසා අපි මහජනතාවගේ ඒ සිතුම් පැතුම්වලට එකඟව, පරිසරයට එකඟව යන්න තමයි සුදු අන්දලා මෙතෙන්ට එවලා දහසක් මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා තමන්ගේ න්‍යාය පත්‍රය වෙනස් කිරීම පස්සට දා ගත යුතුයි. ඒ නිසා කුණු ගොඩක් වෙලා තිබුණ තෙලි

ඇල්ල මනරම් බිමක් වුණා. නමුත් මනරම් වෙලා හිටිය අය තෙලි ඇල්ල තත්වයට පත් වෙලා අද. ඒ නිසා මට පුද්ගලික වර්ණනා වැඩක් නැහැ. නමුත් මගේ හදවතට වේදනාවක් තිබෙනවා ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන මෙය නැති කර ගන්නට බැරි වුනා. ඔබතුමා ඒ යුගය අහවර කරලා මිනිස්සු ඉල්ලපු ඒ පරිසරය, ජල පෝෂිතය, මනරම් පරිසරය  දුන්නා. ඒ නිසා තමයි ඔබතුමාට ප්‍රතිලාභ ලැබෙන්නේ. මේක දේශපාලන සමීකරණයක්. ජනතාව සුඛිතයි මුදිතයි නම් සමාන ලකුණ එහා පැත්තේ ඔබට පෙරලා ප්‍රතිලාභ දෙනවා.  තුල්හිරියේ අපි ගිය වැඩමුළුවකදී රවුමක් ඇඳලා පෙන්නුවා ජනතාව සතුටුයි නම්, උපහාර එනවා. අවසානයේ කතිරයට යනවා යළිත් පුටුවට එනවා.ඒක තමයි මෙහි චක්‍රය. ඒ නිසා එයට අනුව යමින් ඔබතුමාට ඒ උපහාරය ලැබුනේ  වෙන කාරණාවක් නිසා ඒ නිසා ප්‍රදේශය පිඩාවට පත් කරපු කාරණාවක් නිසා. ඒ නිසා පසු ගිය 24 වෙනිදා මටත් සතුටුයි. ඒ වාගේම ඔබතුමාටත් සතුටු ඇති. කෘතවේදීන් මිනිසුන් ලෙස දැක්වූ ලෙන්ගතු උපහාරය පිළිබඳව මම සතුටු වෙනවා. තුංතොට තෙලි ඇල්ල ප්‍රදේශයේ ජනතාවට. තෙලි ඇල්ල සුරැකීමේ සංවිධානයට. විශේෂයෙන් ඔබතුමාටත් පෞද්ගලික න්‍යාය පත්‍රය පැත්තක තියලා අධිකරණයේ මොන තීන්දුව තිබ්බත් මේකට මැදිහත් වෙලා ඒ කටයුත්ත නිමා කිරීම පිළිබඳව සතුටු වෙනවා හය වන සැසිවාරයේ මන්ත්‍රීවරයෙක් ලෙස. ඒ වාගේම පරිසර කමිටුවේ සභාපතිතුමාට සහ නිලධාරීන් ලෙස දැවැන්ත කටයුත්තක් කරපු හැම දෙනාටමත් සහ මට ජවය ශක්තිය දුන්න මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාටමත්, විශේෂයෙන් කොට්ඨාසයේ මන්ත්‍රීවරයා ලෙස උප සභාපතිතුමා විශාල වැඩ කොටසක් පසු ගිය කාලයේ සිදු කලා. ඒ හැම දෙනාටම මාගේ කෘතවේදීත්වය පල කරනවා. බොහොමත්ම ස්තූතියි.

<u>**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**</u>

පසුගිය සැසිවාරයේදී නඩු කියලා විසඳාගන්න දගලලා විසඳා ගන්න බැරි වුණ ප්‍රශ්නයක් . විශේෂයෙන් උප සභාපතිතුමාටත් පෞද්ගලිකව ප්‍රශ්නයක් වුණ, නගරයේ කුණු දැදිගමට ගිය එක. මාස 06ක් තුළ නවත්වනවා කියලා කිව්වා අපි නැවැත්තුවා. එය නැවැත්තුවයි කියලා කැටගොඩින්  අපට කිසි ප්‍රශ්නයක් නැහැ. පොඩි ප්‍රශ්න ටිකක් තියෙනවා පරිසර අධිකාරිය අපිට දුන්න නිර්දේශයන්ට අනුව වළවල් දෙකක් හදන්න ඕනේ. මම ඒක හදන්න ඇස්තමේන්තු හදන්න කියලා කිව්වා. අපට කසළ කළමණාකරණය කර ගන්න පුළුවනකම තිබුනා.ඊට වඩා කසළ දැන් අපට එනවා. නමුත් ඉස්සර තරම් කසළ තල්ලු කරන්න අපි මුදල් වියදම් කරන්නේ නැහැ.ඒ සල්ලි අපට ඉතුරුයි.කසළ පොහොර බවට පත් කරලා මිල කරලා  මුදල් බවට පත් වෙලා සභා අරමුදලට දැන් බැර වෙනවා. ඒ නිසා ඒක කළමණාකරණය කර ගන්න ඕනේ.සමහර වෙලාවට මන්ත්‍රීවරු හිනා වුණා මේක කර ගන්න පුළුවන්ද කියලා.මාස 06ක් තුළ නවත්වනවා කිව්ව විට. නමුත් අපි නැවැත්තුවා. මුහන්දිරම් මන්ත්‍රිතුමාගේ මැදිහත් වීමෙන් උපහාරයක් තිබුනා එතුමාට ස්තූතිවන්ත වෙනවා. දේශපාලඥයෙක් ලෙස සතුට ලැබෙන්නේ වැඩක් කරලා එයින් ලැබෙන ප්‍රතිලාභය. ඒ වෙලාවේ ඇත්තටම මමත් ආණ්ඩු පක්ෂ නියෝජනය කරපු මන්ත්‍රිවරයෙක්. ඒ වෙලාවෙත් මම කිව්වා වරකාපොල කුණු දැදිගමට යනවාට මම විරුද්ධයි කියලා. ඒ පිළිබඳව පත්තරයෙත් පල වුණා. වරකාපොල කුණු වරකාපොල කළමණාකරණය කර ගන්න කියලා තමයි මගේ අදහස තිබුනේ. නමුත් ඒක වුනේ නැහැ. ප්‍රතිලාභ එතුමාට හම්බ වෙයි. ස්වාමීන් වහන්සේ කිව්වා කිසිම දේශපාලඥයෙක් ගෙනත්ලා මේකේ උත්සව තියලා නැහැ කියලා. අද තමයි උත්සව තිබ්බේ.අපට උන්වහන්සේ උදවු කරනවා කියලත් කිව්වා.ඇත්තටම එක මැස්සෙක් වත් නැහැ. අද හොඳ හෝටලයක් හැදිලා. පෞද්ගලික ව්‍යාපාරිකයෙක් තමයි ඒ හෝටලය හැදුවේ. දැන් ඇල්ලට යන මිනිස්සුන්ට එහි නවාතැන් පහසුකම් ලැබිලා. ඒ පිළිබඳව නියාමනයන් අපි විසින් කරන්න ඕනේ. ඒ උත්සවය සංවිධානය කරපු සියළු දෙනාටමත් ස්තූතිය ප්‍රකාශ කරමු. මුහන්දිරම් මන්ත්‍රීතුමාට මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා.

<u>**ගරු මන්ත්‍රී එස්.ආර්.කේ.ලොකුගලප්පත්ති මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, රාජකරුණා මන්ත්‍රීතුමා කරපු දෙවන යෝජනාව හොඳයි.නමුත් එය සංශෝධනය කරන්න අවශ්‍යයි. අපට ප්‍රායෝගිකව සුසාන භූමිවල විතරක් පැළ සිටුවන්න බැහැ. සුසාන භූමිවල රිළව් කාළා විනාශ කරනවා. පොදු ස්ථානවල පැළ සිටුවන්න ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ප්‍රජාශාලා වලට, පාසල් වලට හා පන්සල්වලත් මෙම පැළ සිටුවන්න ලබා දෙන්න.

<u>**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**</u>

ඒක හොඳයි ඉන් පස්සේ ඒක නඩත්තු වෙනවානේ. අපි එහෙම කරමු.

<u>**ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප්  මැතිතුමා**</u>

ඒ යෝජනාව සංශෝධන වලට යටත්ව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 01 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ සංශෝධන වලට යටත්ව ඒකමතිකව සහා සම්මත විය.***

**ඉ - 02**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2023 වර්ෂය සඳහා නෙළුන්දෙණිය ආයුර්වේද ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර අංක 01 ටෙන්ඩර් කිරීමේදී ඒ සඳහා වැඩිම ලංසු මුදලක් ඉදිරිපත් කල 46 කණුව අසළ, අඹන්පිටිය, ගලිගමුව නගරයේ පදිංචි එම්.ඒ.තිලක් නිල්මිණි මහතාට එම ටෙන්ඩරය හිමි විය. එනමුදු එම මහතා මෙම කඩ කාමරය සඳහා ගිවිසුම් ගත වීමට නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති හෙයින් ඉන් පසුව මෙම කඩ කාමරය සඳහා වැඩිම ලංසු මුදලක් ඉදිරිපත් කල එස්.ඒ හසිත ඔෂාන් සුහසිංහ මහතා එම ටෙන්ඩරය සඳහා සුදුසුකම් ලැබුවද ඔහුද එම කඩ කාමරය සඳහා ගිවිසුම් ගත වීමට නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇත. එමෙන්ම නෙළුන්දෙණිය ආයුර්වේද ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර අංක 02 ටෙන්ඩර් කිරීමේදී ඒ සඳහා වැඩිම ලංසු මුදලක් ඉදිරිපත් කල එස්.ඒ.හසිත ඔෂාන් සුහසිංහ මහතාට එම ටෙන්ඩරය හිමි විය. ඒ අනුව නෙළුන්දෙණිය ආයුර්වේද ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර අංක 01 හා 02 යන කඩ කාමර දෙකම අංක 77, නුවර පාර, ගලිගමුව යන ලිපිනයේ පදිංචි එස්.ඒ.හසිත ඔෂාන් සුහසිංහ මහතාට හිමි වුවද කඩ කාමර 01 හා 02 සඳහා ගිවිසුම් ගත වීමට නොපැමිණෙන බව එස්.ඒ හසිත ඔෂාන් සුහසිංහ මහතා ලිඛිතව දැණුම් දී ඇති බැවින් මෙම කඩ කාමර දෙක නැවත දෙවන වර ප්‍රාදේශීයව දැණුවත් කර ටෙන්ඩර් කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

මේ ටෙන්ඩරය ලබා ගත්ත අය මේක ගන්නේ නැහැ කියලා කියනවා. ඒ නිසා නැවත ටෙන්ඩර් කරන්න සුදුසුයි කියලා තමයි යෝජනා කළේ. ලොකු මුදලකට ඒක ටෙන්ඩර් කරලා තිබුනේ. ආපසු ටෙන්ඩර් කරන්න තින්දු කලා.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

මම අද උදේ දැක්ක දෙයක්. දෙසැම්බර් 31 වන විට අපි ටෙන්ඩර් කරපු කඩ වල කාලය අවසන් වූ ස්ථාන කිහිපයක්ම තාම විවෘත කරලා තිබෙන්නේ.නෙළුන්දෙණියේ කඩවල් දෙකම ඇරලා අද එයාලමනේ බෑ කියන්නේ.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

මම ගිහින් බැලුවා වාරියගොඩ එක වහන්න කිව්වා. මම විෂයට මතක් කලා. පොලිසියෙන් දාලා තහනම් කරන්න කිව්වා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 02 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**ඉ - 03**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් අලව්වත්ත සණස පුර වෙන්දේසි ඉඩමේ පිහිටි පර්චස් 40ක ඉඩම් කොටස ( පොල් ගස් 12ක් සහිත) ආදායම් පරීක්ෂක වාර්තාව අනුව රු.12000.00ක අවම තක්සේරුව ලෙස පදනම්

කරගෙන ටෙන්ඩර් කර වාර්ෂිකව තාවකාලික බෝග වගාවට බදු දිම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

අපි මේ ඉඩම් බලන්න ගියා. පොල් ගස් 12ක් තිබෙනවා. ආදායම එන්නේ නැහැ. එක එක මිනිස්සු ඒවා කඩා ගෙන යනවා. අප සතු ඉඩම් සියල්ලම ගැන හොයලා බලලා මං කිව්වා ටෙන්ඩර් දමන්න කියලා. එකක් තමයි සභාවට ආදායමක් එන එක, අනික ඉඩම අයාලේ යන්නේ නැතුව පාලනයකට නතු වීම. සංඝස පුර ඉඩම බලලා ටෙන්ඩර් දාන්න කිව්වා. සංඝසපුර සමිතියක් ඉල්ලීමක් කලා, ඒ ඉඩම දෙන්න කියලා. මට ඒක එහෙම දෙන්න බැහැ. ඒ නිසා අපි ප්‍රසිද්ධ දැන්වීමක් දමලා ටෙන්ඩර් කරලා වැඩිම ලංසුවට දෙනවා. පරාක්‍රමගම ඉඩම් දෙකත් ටෙන්ඩර් කරලා අපිට රුපියල් හතළිස් දහසක් එනවා. මේකත් ටෙන්ඩර් කරපු විට අපට ආදායමක් එනවා.

**ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා**

මම දන්න විදිහට මේකේ කොටස් පහක් තිබෙනවා. මේ කොටස් පහම සභාපතිතුමා මේකට ඇතුලක් කරලා දුන්නා නම් හොඳයි. එහි ගෙඩි හට ගන්නා කොස් ගස් තිබෙනවා. සභාවෙන් එන්නේ නැති වෙයි කියලා අහළ පහල කට්ටිය ගස් හිටවලා වැටවල් ගසා ගෙන. කවුරු හෝ ගන්න පුද්ගලයාට සභාවෙන් ගිහිල්ලා පෙන්වලා දීලා අපේ සීමාව කියලා පෙන්වලා දුන්නොත් හොඳයි .එතකොට ඒ පුද්ගලයාට මේක ආරක්ෂා කර ගන්නට පුළුවන්.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

කුමාර මන්ත්‍රීතුමා පර්චස් 40 තිබෙන ඉඩම තමයි පොල් ගස් 12ක් තිබෙන්නේ. අපි ඒක දැනට දාමු. ඉතුරු ටිකත් අපි ටෙන්ඩර් දමමු.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 03 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 04**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් අලුතින් ආරම්භ කරන ලද තල්ලියද්ද සත්සර පෙර පාසලේ මාසික විදුලි බිල්පත් සහ ජල බිල්පත් සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එස්.ආර්.කේ ලොකු ගලප්පත්ති මැතිතුමා.**

මෙවා පාවිච්ච කිරිමේ සීමාවක් කළොත් හොඳයි නේද.

***ඒ අනුව මෙම කල් දි ඇති යෝජනාව තීරණ අංක ඉ- 04 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 05**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

පළාත් පාලන දෙපාර්තමේන්තුව (සබරගමුව පළාත් සභාව) විසින් එවන ලද CLG/DE/03 අංක දරන සහ 2022.12.09 දිනැති ලිපිය අනුව ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන්ට පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහනක් 2023 අධ්‍යයන වර්ෂයට ප්‍රථම සංවිධානය කළ යුතුව ඇත.

ඒ අනුව 2023 අයවැය ලේඛනයේ 607(9)9 වැය ශීර්ෂයෙන් රු.1000000.00ක මුදලක් වෙන් කර ඇත. 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 132 (ඒ) වගන්තිය යටතේ පූර්ව අනුමැතිය ඇතිව විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

පලාත් සභාවෙන් ලිපියක් එවලා තිබුණා, ආණ්ඩු පක්ෂ මන්ත්‍රිතුමන්ලාගේ කණ්ඩායම් සාකච්ඡාවේදී අපි කිව්වා මෙම වර්ෂයට අදාල 1000000.00ක් මුදලක් අය වැය ලේඛනයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ට වෙන් වන මුදල ලක්ෂය ගානේ දාලා ගේන්න ඕනේ කියලා කිව්වා. ඒකත් එකතු කරලා ලැයිස්තුව සකස් කරලා ආණ්ඩුකාර අනුමැතියට යවන්න ඕනේ. අනුමැතියට යවලා ටෙන්ඩර් කරලා තමයි ගන්න ඕනේ.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 05 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ-06**

**කර්මාන්ත කමිටුවේ ගරු සභාපති එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

**2022.12.20 වන දින පැවති කර්මාන්ත කමිටුවේ කල් දී ඇති යෝජනාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.**

01. ඇස්තමේන්තු

| අනු අංකය | ව්‍යාපෘතිය | වැය ශීර්ෂය | ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 01 | ඉහළගම පොල්කොටුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 309(2) | 200000.00 |

**ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**සංශෝධන**

**02.ඇස්තමේන්තු**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | වැය ශීර්ෂය | ඇස්තමේන්තු මුදල |
|---|---|---|---|
| 01. | වෙනිවැල්ලකඩුව ප්‍රජාශාලා භූමියේ සේදී ගිය කොටස සංවර්ධනය කිරීම | (2)309 | 100000.00 |
| .02 | කළුගල පෙරේරා මහතාගේ නිවස දෙසට මාර්ගය නඩත්තු කිරීම | (2)309 | 100000.00 |

| | | | |
|---|---|---|---|
| .03 | වෙනිවැල්ලකඩුව පුවක් ඇල්ල මාර්ගය නඩත්තු කිරීම | (2)309 | 100000.00 |
| .04 | වද්දෙනිය තිලක් මහතාගේ නිවස දෙසට මාර්ගය නඩත්තු කිරීම | (2)309 | 100000.00 |
| 05 | වද්දෙනිය සුරපුර රබර් වත්ත අසල කොටස නඩත්තු කිරීම | (2)309 | 100000.00 |
| .06 | නියදුරුපොල එක්සත් අවමංගල්‍යාධාර සමිති ශාලාවේ ඉතිරි වැඩ සඳහා | (2)309 | 297847.51 |
| 07 | ගනේගම අමරේ මහත්මාගේ කම්මල අසලින් ඇති අතුරු පාර නඩත්තු කිරීම | (2)309 | 300000.00 |
| 08 | කොණ්ඩගල ඉහළ ගම්මැද්ද මාර්ගය සංවර්ධනය කිරීම | (2)309 | 500000.00 |
| 09 | වරකාපොල ඇවිදින මංතීරුවේ ආපදාවට පත්වන ඇල ඉවුරු හා අමුණ පෙදෙස ආරක්ෂක බැමි ඉදි කිරීම | (2)309 | 2000000.00 |

**<u>03.වැඩ අවසන් ගෙවීම්</u>**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරු | වැය ශීර්ෂය | වැඩ අවසන ගෙවීම(රුදවුම සමඟ) |
|---|---|---|---|---|
| .01 | වරකාපොල ඇවිදින මංතීරුවට තෙකලා විදුලිය ලබා ගැනීමට කාමරයක් ඉදි කිරීම සහ අභ්‍යන්තර තතැඳුම සකස් කිරීම | සී/ස වරකාපොල විවිධ සේවා සමූපාකාර සමිතිය | (2)309 | 693248.12 |
| .02 | තල්ලියද්ද දම්මුල්ල මාර්ගයේ ගෙදරවෙල කොටසේ නඩත්තු කටයුතු සිදු කිරීම | සී/ස වරකාපොල විවිධ සේවා සමූපාකාර සමිතිය | (2)309 | 999772.84 |
| .03 | දෙල්ගමුව පාසැල් මාර්ගයේ කඳු කොටසේ අපහසු ස්ථාන කොන්ක්‍රීට් කිරීම | දෙල්ගමුව වැඩිහිටි සංවිධානය දෙල්ගමුව වසම | (2)309 | 198684.40 |
| .04 | අඹේපුස්ස දේවාල මාර්ගයේ යාමට අපහසු ස්ථාන සංවර්ධනය කිරීම | සී/ස වරකාපොල විවිධ සේවා සමූපාකාර සමිතිය | (2)309 | 299859.16 |
| .05 | අල්ගම දෙයියගහ මාර්ගය සංවර්ධනය කිරීම(දුෂ්කර ස්ථාන සකස් කිරීම) | සී/ස වරකාපොල විවිධ සේවා සමූපාකාර සමිතිය | (2)309 | 500000.00 |
| 06 | තෝලංගමුව පීල්ලවලකඩ මාර්ගයේ ගස්නාවත්ත පැළ තවාන දක්වා දිවෙන මාර්ගයේ ප්‍රේමතිලක මහතාගේ නිවස ළඟ සිට පැළ තවාන දෙසට ඇති කොටස බැකෝ යන්ත්‍රයක් මගින් කපා සංවර්ධනය කිරීම | ගස්නාව ගොවි සංවිධානය, ගස්නාව , තුල්හිරිය | (2)309 | 200000.00 |
| .07 | අල්ගම එගොඩගම පුවත්තාගල මාර්ගයේ කැඩී ඇති කොටස් පිළිසකර කිරීම | නිල්වලා එක්සත් සුභසාධක සමිතිය, ඉහළගම අල්ගම | (2)309 | 495485.50 |
| 08 | තාඹුගල දෙකේ කණුව (බජ්ජාගල) අසලින් දිවෙන අල්ගම වත්ත මාර්ගයේ පැති බැම්ම ඉතිරි වැඩ නිම කිරීම. | තාඹුගල සුහද ග්‍රාම සංවර්ධන සමිතිය , තාඹුගල, දංඕවිට | (2)309 | 500000.00 |
| 09 | ගොඩවෙල කඹුරාදෙණිය ඉහළ වී පැල පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම | ගැමුනු ගොවි සංවිධානය,තාඹුගල | (2)309 | 199794.67 |
| 10 | මහපල්ලේගම කළුගමහේනවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | මහපල්ලේගම ගොවි සංවිධානය, මහපල්ලේගම | (2)309 | 189274.04 |
| 11 | පල්ලේපැල්පිට සුසාන භූමියේ සුසානාගාරය අලුත්වැඩියා කිරීම | සමගි වැඩිහිටි පුරවැසි සංවිධානය, පල්ලේපැල්පිට, කොටියාකුඹුර | (2)309 | 221369.14 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | වැල්හැල්ල මායින්නොළුව මාර්ගයේ වසන්ත මහතාගේ නිවසට ඉහළින් ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම | පහල ලෙනගල ගොවි සංවිධානය, පහල මායින්නොළුව, වේරගල | (2)309 | 500000.00 |
| 13 | දන්දෙනිය නාගලකන්ද මාර්ගයේ අබලන්ව ඇති කොටස සංවර්ධනය කිරීම | සමගි වැඩිහිටි පුරවැසි සංවිධානය, පල්ලේපැල්පිට, කොටියාකුඹුර | (2)309 | 299847.70 |
| 14 | බටේ කොළනිය අටාල පාලම ඇන්ද පිළිසකර කිරීම | සී/ස වරකාපොල විවිධ සේවා සමූපාකාර සමිතිය | (2)309 | 449394.72 |
| 15 | දිප්පිටිය සේනානායක මාර්ගයේ දුෂ්කර ස්ථාන සඳහා ගල් පස් යෙදීම | පැරකුම් වැඩිහිටි සමිතිය, මල්මඩුව. | (2)309 | 100000.00 |
| 16 | මල්මඩුව එළමල්දෙණිය මාර්ගයේ මුල් කොටසේ අබලන් වූ කොටස තාර යොදා සංවර්ධනය කිරීම | පැරකුම් වැඩිහිටි සමිතිය, මල්මඩුව. | (2)309 | 400000.00 |
| 17 | කිණිවිට රවන මීදෙල්ල බකමූණ දොරොව්ව මාර්ගය වැඩි දියුණු කිරීම | මහපල්ලේගම ගොවි සංවිධානය, මහපල්ලේගම | (2)309 | 300000.00 |
| 18 | දැදිගම සේවා පියස හා බහු කාර්යය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම | දැදිගම ජයලත් කන්ද ග්‍රාම සංවර්ධන සමිතිය, දැදිගම | (2)309 | 500000.00 |

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

මේ වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල් පිළිබඳව  තවම බැලුවේ නැහැ. ඒ මුදල් වලට අදාල ඇස්තමේන්තු ආණ්ඩු පක්ෂයට හා විපක්ෂයට දෙන මුදල පිළිබඳව ආණ්ඩු පක්ෂයත් එක්ක කතා කරන්න ඕනේ. ඒ අනුව ඒ අදාල ඇස්තමේන්තු හදන්න ඕනේ. ඔබට ලබා දුන්න මුදල් ඔබ හරියට පාවිච්චි කලේ නැහැ. ඒ අනුව මට මොකුත් කියන්න එපා දෙසැම්බර් 31 වෙනිදා දිනය දාලත් අරගෙන එනවා හැකියා සහතිකයක්. බලන්නකෝ කොහොමද කරන්නේ මම. දෙසැම්බර් 31 කර්මාන්තය අවසන් වෙන්න ඕනේනේ. දවස් හතක් වත් නැතුව ගිවිසුමක් අත්සන් කරන්න පුළුවන්ද. 31 ක් වෙනිදට හැකියා සහතිකයක් අරගෙන එනවා ගිවිසුමක් අත්සන් කරන්නට. දෙයි හාමුදුරුවනේ කර්මාන්ත නොකරපු අයද මේ ඉන්නේ කියලා මම කල්පනා කලා. කොහොමද කරන්නේ වැඩක්. පියුශාන් මන්ත්‍රීතුමා මැදිහත් වෙලා සාකච්ඡාවක් තියලා ඇස්තමේන්තු ටික කඩිනමින් හදන්න. ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ අය ගිහිල්ලා ඇස්තමේන්තු ටික හදලා සභාවට දාගන්න.මාර්තු මාසය දක්වා මේ සභාව දුවනවා දැන්. නාම යෝජනා කැඳෙව්වා වුනත් රීට් ආඥාවක් මේ මැතිවරණය තියන්න එපා කියලා. රීට් ආඥාවේ සාක්ෂි විදිහට කැඳවලා තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මැතිවරණ කොමසාරිස් වාගේ අය. මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රකාශ කරනවා ඡන්දයක් තියන්න මුදල් වියදම් කළොත් ආපසු සැරයක් වී ටික මිලදී ගන්නවත් බැරි වෙයි කියලා මේ ආර්ථික තත්වයත් එක්ක. ඒ නිසා මම දන්නේ නැහැ අධිකරණයේ දෙන තීන්දුව මොකක්ද කියලා. මාර්තු මාසය දක්වා  බලාත්මකව සභාව ක්‍රියාත්මක වෙනවා.මම දන්න හැටියට අද ගැසට් නිවේදනයක් නිකුත් වෙනවා මම දන්න හැටියට මැතිවරණයකට යම් වාසියක් වන වැඩ සභාව විසින් කරන්න බැහැ.  එය එනතෙක් ආණ්ඩු පක්ෂ හා විපක්ෂ මන්ත්‍රීවරු ලැහැස්ති වෙලා තමන්ට හිමි ප්‍රතිපාදන වල වැඩ කටයුතු කරන්න කල් ගත වෙන්න එපා.

**ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න  මැතිතුමා**

ඒ යෝජනාව සංශෝධන වලට යටත්ව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 06 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 07</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>**

2022.11.24 සිට 2022.12.23 දක්වා වූ ආවරණ අනුමැතියට යටත්ව කරන ලද රු. 3,292,258.01 ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එන්.පී. බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම කල් දී ඇති යෝජනාව තීරණ අංක ඉ- 07 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 08</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 අනුව ප්‍රායෝගික පුහුණුව සඳහා 2023 වර්ෂය සඳහා වරකාපොල ප්‍රාදේශිය සභාව තුළ ප්‍රායෝගික පුහුණුව සඳහා සිසුවෙකු බඳවා ගැනීම සඳහාත්, බඳවා ගන්නා සිසුවා සඳහා දිනකට රු.500.00ක දීමනාවක් මාස 06ක කාලයක් දක්වා ගෙවීමටත් සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

1.කුමුදුමාලා කාංචනමාලා මෙනවිය - තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී

**<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 08 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 09</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

වරකාපොල සතිපොල භූමියේ ඉදිකරන ලද නව කඩ කාමර ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ අංක 10,13,14 යන කඩ කාමර 03 දීර්ඝ කාලීන බදු පදනම යටතේ 2023 වර්ෂයේ සිට වසර 30 කාලසීමාවක් සඳහා බදු ලබා දීම සඳහා වූ 2022.12.09 වන දින දිනමිණ පුවත්පතේ පලකල ප්‍රසම්පාදන දැන්වීම අනුව ටෙන්ඩර් විවෘත කිරීම 2022.12.30 වන දින පෙ.ව 10.15 ට වරකාපොල ප්‍රාදේශීය සභාවේදී සිදු කරන ලදී. ඒ සඳහා වූ පහත සඳහන් ටෙන්ඩර් මණ්ඩල නිර්දේශ පිළිගැනීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

**01.** වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 10 කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර 01 ක් ලැබී තිබුණි.මෙහි අවම ලංසු මුදල රු. 840000.00 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| එච්.ආර්.ඒ.සේනානායක මයා | ඒ/70/1,බෝපිටිය,සබර,වරකාපොල | 860000.00 |

වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 10 කඩ කාමරය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම්පතක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් එම දේපල සඳහා එච්.ආර්.අරවින්ද සේනානායක මහතාගේ ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය නිර්දේශ කරන ලදී.

**02.** වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 13 කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර 01 ක් ලැබී තිබුණි.මෙහි අවම ලංසු මුදල රු. 840000.00 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| එච්.ටී.නිමල් කරුණාතිලක මයා | පිස්සපොලවත්ත,අඹගල,වරකාපොල | 841000.00 |

වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 13 කඩ කාමරය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් එම දේපල සඳහා එච්.ටී.නිමල් කරුණාතිලක මහතාගේ ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය නිර්දේශ කරන ලදී.

03. වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 14 කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර 01 ක් ලැබී තිබුණි.මෙහි අවම ලංසු මුදල රු. 840000.00 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| ජී.එල්.එල්.එච්.ගුණවර්ධන මයා | සී/33,පහලගම,නියදුරුපොල,වරකාපොල | 850000.00 |

වරකාපොල සතිපොළ භූමියේ ඉදි කරන ලද කඩ කාමරවල ඉහල මාලයේ අංක 14 කඩ කාමරය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් එම දේපල සඳහා ජී.එල්.එල්.එච්.ගුණවර්ධන මහතාගේ ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය නිර්දේශ කරන ලදී.
ඒ අනුව ඉහත ටෙන්ඩර් මණ්ඩල නිර්දේශ පිළිගැනීම සුදුසු බවටත් ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් මම මේ ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 09 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ - 10**

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.**

2023 වර්ෂය සඳහා දෙවන වර ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් නොවූ මස් මාළු කඩ,මාළු ලැලි, කඩ කාමර, පොදු වැසිකිළි,හෝරා ස්ථම්භ හා වාරියගොඩ සතිපොල බදු දීම සඳහා වූ තෙවන වර ටෙන්ඩර් විවෘත කිරීම 2022.12.30 වන දින පෙ.ව 10.15 ට වරකාපොල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී සිදු කරන ලදී. ඒ සඳහා වූ පහත සඳහන් ටෙන්ඩර් මණ්ඩල නිර්දේශ පිළිගැනීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

**01.**වර/සතිපොල කඩ කාමර අංක 01 එළුමස් කඩය සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත් 01 ලැබී තිබුණි. මෙහි අවම ලංසු මුදල රු163468.80 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| සලීම් මොහමඩ් පරීනා මිය | ගොඩවෙල, දංඕවිට | 163470.00 |

වර/සතිපොල කඩ කාමර අංක 01 එළු මස් කඩය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් එම දේපල සඳහා සලීම් මොහමඩ් පරීනා මියගේ ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය නිර්දේශ කරන ලදී.

**02.**වර/සතිපොල කඩ කාමර අංක 06 එළ හරක් මස් කඩය සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත් 01 ක් ලැබී තිබුණි. මෙහි අවම ලංසු මුදල රු. 1389603.60 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| මොහමත් සබූර් මොහම්මදු නුමාන් මයා | අංක 50, මස්ජිඩ් මාවත,වරකාපොල | 1389610.00 |

වර/සතිපොල කඩ කාමර අංක 06 එළ හරක් මස් කඩය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් එම දේපල සඳහා මොහමත් සබූර් මොහම්මදු නුමාන් මහතාගේ ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය නිර්දේශ කරන ලදී.

**03.**නාංගල්ල එළ හරක් මස් කඩය සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත් 01 ක් ලැබී තිබුණි. මෙහි අවම ලංසු මුදල රු. 298911.13 කි.

| නම | ලිපිනය | ලංසු මුදල (රු) |
|---|---|---|
| අබුල් හසන් මුහම්මදු රිපායි මයා | 70, මංගෙදර, තුල්හිරිය | 298920.00 |

නාංගල්ල එළ හරක් මස් කඩය සඳහා එක් ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයක් පමණක් ඉදිරිපත් කර තිබුණද අවම ලංසු මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩර් මුදල සඳහන් කර තිබූ බැවින් එම දේපල සඳහා අබුල් හසන් මුහම්මදු රිපායි මහතාගේ ටෙන්ඩරය පිළිගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය නිර්දේශ කරන ලදී. ඒ අනුව එම ටෙන්ඩර් මණ්ඩල තීරණ පිළි ගැනීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

ඉහත සඳහන් සභා දේපළ වලට අමතරව තෙවන වරටද ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් නොවූ

01. වරකාපොල සතිපොල කඩ කාමර අංක 04 කුකුල් මස් 01 කඩය
02. වරකාපොල සතිපොල කඩ කාමර අංක 05 කුකුල් මස් 02 කඩය
03.අගුරුවැල්ල පාර තල්ලියැද්ද වරිපනම් අංක 409 ඇස්බැස්ටෝස් සෙවිළි ට්‍රාන්ස්පෝමරය දරණ ගොඩනැගිල්ල
04.නෙළුන්දෙණිය පොදු වැසිකිළිය.
05.දැදිගම පොදු වැසිකිළිය

06.වාරියගොඩ පොදු වැසිකිළිය.
07.මීරිගම හංදිය පොදු වැසිකිළිය
08.වරකාපොල නගර මධ්‍යයේ පිහිටි හෝරා ස්ථම්භය.
09.අඹේපුස්ස හංදියේ පිහිටි හෝරා ස්ථම්භය.
10.වාරියගොඩ සතිපොල

ස්ථානයක් තමා විසින් සකසා ගත යුතුය යන පදනමේ සිට ටෙන්ඩර් කරනු ලැබූ
01.වාරියගොඩ හංදිය මාළු ලැල්ල.
02.අල්ගම හංදිය මාළු ලැල්ල.
03.අඹේපුස්ස හංදිය මාළු ලැල්ල
04.උඩුකුඹුර හංදිය මාළු ලැල්ල.
05.දැදිගම හංදිය මාළු ලැල්ල
06.ගණිතපුර හංදිය මාළු ලැල්ල.
07.බෝපිටිය හංදිය මාළු ලැල්ල
08.තුල්හිරිය හංදිය මාළු ලැල්ල
09.උඩුවක හංදිය මාළු ලැල්ල.
10.බෙලිගල හංදිය මාළු ලැල්ල.
11. තල්ගම හංදිය මාළු ලැල්ල.
12. මාහේන හංදිය මාළු ලැල්ල.
13. මහපල්ලේගම හංදිය මාළු ලැල්ල.
14. මල්මඩුව හංදිය මාළු ලැල්ල.
15. ඉඹුලෝවිට හංදිය මාළු ලැල්ල.
16. මායින්නොළුව මාළු ලැල්ල.(අලුතින් හදුනාගත්)

යන අංක 01සිට 10 දක්වා වූ සභා දේපළ හා අංක 01 සිට 16 දක්වා ඇති මාළු ලැලි තෙවන වරටද ටෙන්ඩර් නොවූ බැවින් සිව්වන වර ප්‍රාදේශීයව ටෙන්ඩර් කිරීමට මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 10 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සහා සම්මත විය.***

**<u>ඉ - 11</u>**

<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>

වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් නව නගර ශාලාව අලුතින් ඉදිකිරීමේ ව්‍යාපෘතිය කෑඳරාගම කන්ස්ට්‍රක්ෂන් විසින් ටෙන්ඩර් මඟින් ලබා ගත් අතර , ඉන් අදියර කිහිපයක් මේ වන විට නිම කර ඇත. නමුත් පවතින ආර්ථික තත්වය මත සීඝ්‍රයෙන් වෙළඳපොල ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා අඩක් නිම කල එම ව්‍යාපෘතියෙන් ඔහු ලිඛිතව ඉල්ලා අස්වී ඇත.

දැනට ඔහු සඳහා ගිවිසුම් ගත බැදීම අවසන් වි ඇති බැවින් එම අයගේ ඉල්ලීම මත බැංකු සුරක්ෂණය නිදහස් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 11 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 12</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

සභාවට අයත් ZA-5220 බැකෝ යන්ත්‍රයේ ජැක්සීල් අලුත්වැඩියා කිරිමට අවශ්‍යව ඇති බැවින් හසිත මෝටර්ස් ගරාජ් ආයතනය වෙත යොමුකර එම ආයතනය මගින් ලබාදුන් ඇස්තමේන්තුව යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර නිර්දේශය ලැබී ඇති බැවින් ඉහත ආයතනය මගින් ජැක්සීල් අලුත් වැඩියාව සිදුකිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>හසිත මෝටර්ස් ගරාජ්</u>

| | | |
|---|---|---|
| ජැක් සීල් බකට් බූම් | - | රු.12500.00 |
| ජැක් පොලිෂ් කිරීම හා අලුත්වැඩියාව | - | <u>රු .10500.00</u> |
| | | <u>රු . 20500.00</u> |

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 12 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 13</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**
සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා අවශ්‍ය ග්‍රීස් වරකාපොල විවිධ සේවා සමුපකාර සමිතිය සතුව නොමැති බව ලිඛිතව දන්වා ඇත. අවශ්‍ය ග්‍රීස් ප්‍රමාණය සබරගමුව පළාත් නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සතුව පවතින බැවින්, එම ආයතනයට මුදල් ගෙවා අවශ්‍ය ග්‍රීස් ප්‍රමාණය මිලදී ගැනීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 13 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 14</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**
සභාවට අයත් ZA-2382 බැකෝ යන්ත්‍රයේ ජැක්සීල් හා ඇක්සල් බූට් අලුත්වැඩියා කිරිමට අවශ්‍යව ඇති බැවින් හසිත මෝටර්ස් ගරාජ් ආයතනය වෙත යොමුකර එම ආයතනය මගින් ලබාදුන් ඇස්තමේන්තුව යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර නිර්දේශය ලැබී ඇති බැවින් ඉහත ආයතනය මගින් ජැක්සීල් හා ඇක්සල් බූට් අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>හසිත මෝටර්ස් ගරාජ්</u>**

| | |
|---|---|
| ජැක් සීල් බකට් | - රු. 4900.00 |
| ලීවර් බූට් ප්ලාස්ටික් රින් 2 | - රු. 2440.00 |
| ලීවර් බූට් 2 | - රු. 10600.00 |
| සේවා ගාස්තු | - රු. <u>10500.00</u> |
| | රු.<u>28440.00</u> |

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 14 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 15</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

සභාවට අයත් RE -2270 ට්‍රැක්ටරයේ ගැස්කට් හා ජැක් පොම්පය අලුත්වැඩියා කිරිමට අවශ්‍යාව ඇති බැවින් සේන මෝටර් වර්ක්ස් ආයතනය වෙත යොමුකර එම ආයතනය මගින් ලබාදුන් ඇස්තමේන්තුව යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර නිර්දේශය ලබා ගෙන ඇති බැවින් සේන මෝටර් වර්ක්ස් ආයතනය මගින් ට්‍රැක්ටරයේ ගැස්කට් හා ජැක් පොම්පයේ අලුත්වැඩියාව සිදුකිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>සේන මෝටර් වර්ක්ස්</u>

| | |
|---|---|
| හෙඩ් එක ගලවා ගැස්කට් සපයා සවිකිරීම | - රු. 28500.00 |
| ටැපට් කවර පැකින් සපයා සවිකිරීම | - රු . 4500.00 |
| වැල් ඔයිල්සීල් සපයා සවිකිරීම | - රු . 18250.00 |
| ට්‍රැක්ටරයේ ජැක් පොම්පය අලුත්වැඩියා කොට සවිකිරීම | - <u>රු. 22500.00</u> |
| | <u>රු 73750.00</u> |

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 15 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 16</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

වාරියගොඩ පාලම අසළ මාළු ලැල්ල පළමුවර ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් වුවත් ගිවිසුම්ගත වීමට ඉදිරිපත් නොවීම නිසා ප්‍රාදේශීයව දැණුවත් කර 2023.02.15 සිට 2023.12.31 දක්වා දෙවන වර ටෙන්ඩර් කිරීමට මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

ස්ථානයක් සපයා ගත යුතු මාළු ලැලි

| අනු අංකය | මාළු ලැල්ලේ නම | ආකෘති පත්‍ර ගාස්තුව | ටෙන්ඩර් ඇප මුදල | අවම ලංසුව (රු) |
|---|---|---|---|---|
| 01 | වාරියගොඩ පාලම අසළ මාළු ලැල්ල | 1500.00 | 2000.00 | 38018.74 |

<u>ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 16 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ඉ - 17</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව.</u>**

සභාවට අයත් LL -7740 කෘෂ කැබ් රථයේ තිරිංග පද්ධතිය අලුත්වැඩියා කිරිමට අවශ්‍යව ඇති බැවින් සීවලී මෝටර්ස් ආයතනය වෙත යොමුකර එම ආයතනය මගින් ලබාදුන් ඇස්තමේන්තුව යන්ත්‍රෝපකරණ අධිකාරියේ මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර නිර්දේශය ලබා ගෙන ඇති බැවින් ඉහත ආයතනය මගින් බ්‍රේක් සිලින්ඩර් අලුත්වැඩියාව සිදුකිරීම සුදුසු බවට මම ගරු සභාවට යෝජනා කරමි.

<u>සීවලී මෝටර්ස්</u>

1. හබ් 4 ගලවා බ්‍රේක් සිලින්ඩර් 8 දමා සවිකිරීම - රු. 11800.00
2. බ්‍රේක් ලයිනර් ගැසීම(ඉදිරිපස/)පසුපස - රු. 13400.00
3. ඉදිරිපස සිලින්ඩර් 4 සදහා - රු. 34400.00
4. පිටුපස සිලින්ඩර් 4 සදහා - රු. 38800.00
5. බ්‍රේක් ඔයිල් - රු. 3800.00

මුලු වියදම - රු. 102200.00

<u>ගරු මන්ත්‍රී එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 17 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**ඉ- 18**

**<u>ගරු උප සභාපති ආර්.ඇම්.ඒ.එන්.රණතුංග මැතිතුමා, ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා, ගරු මන්ත්‍රී එස්.එච්.ඩී.පී.රණතුංග මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.පී.බුද්ධික ලක්මාල් කරුණාරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී පී.ජී. මංජු ශ්‍රී ජයශාන්ත මැතිතුමා යන අය විසින් කරනු ලබන යෝජනාවයි.</u>**

<u>2022.11.03 වන දින වරකාපොල ප්‍රාදේශීය සභාවේ පැවති මාසික මහ සභා රැස්වීමේ තීරණ අංක ඉ - 15 යටතේ සභා සම්මත වූ කල් දී ඇති යෝජනාවට සංශෝධිත යෝජනාවයි.</u>

වරකාපොල නගර මධ්‍යයේ පිහිටි වරකාපොල ප්‍රාදේශීය සභාව සතු ඉතා පැරණි ගරා වැටෙමින් තිබූ වරකාපොල පැරණි නගරශාලා ගොඩනැගිල්ල කඩා ඉවත් කර, ආර්ථික වශයෙන් ඉතා වැදගත් වූ ස්ථානයක පිහිටි එම භූමියේ පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ රු.64,077,193.06 ක ප්‍රතිපාදන මත වරකාපොල නගරශාලා ගොඩනැගිල්ල අලුතින් ඉදිකිරීම - 1 අදියර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2021.09.09 දින ආරම්භ කරන්නට යෙදිණ.

2021 අවසන් කාර්තුවේ පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් පාදම සඳහා කාණු කැපීමේදී නිරන්තරයෙන් ජලය පිරීම හා පස් තට්ටු කඩා වැටීමකට ලක්විය. එම නිසා ඉදිකිරීම් කටයුතු සඳහා මහත් පිරිවැයක් දැරීමට සිදුවිය. එසේම සිමෙන්ති ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය සපයා ගැනිමටද ඉතාම අපහසු වූ අතර, එම හේතු නිසා 2021 වර්ෂය තුල මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට අපහසු විය. රට තුළ පවත්නා මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අවිච්ඡේද කර නොමැත.

මෙම ව්‍යාපෘතියේ 35%ක පමණ වැඩ අවසන් කර ඇති අතර, ඒ වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවා ඇති බිල්පත් වටිනාකම රු.18,098,679,06 කි. එසේම රු.2,100,511.05 ක වටිනාකමකින් යුතු බිල්පතක් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. තවද එම අමාත්‍යාංශ ලේකම්ගේ PL/03/01/BP පොදු ගොණුව හා 2022.03.22 දිනැති ලිපියෙන් ලබා දී තිබූ උපදෙස් පරිදි ප්‍රතිපූර්ණය කරගැනීමේ පදනම මත සභා අරමුදලින් රු.16,051,62.16ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇත.

මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය 2022.06.06 දිනෙන් අවසන්ව ඇත. ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිළ, ප්‍රවාහන හා යන්ත්‍ර සූත්‍ර මිළ ඉහළ යාම නිසා ගිවිසුම්ගත ඇස්තමේන්තුවට අනුව වැඩ නිම කල නොහැකි බැවින් කොන්ත්‍රාත්කරු සමඟ අන්‍යෝන්‍ය එකඟතාවයකින් යුතුව ගිවිසුම අවලංගු කර ගැනීම සුදුසු බවත්,

මෙම ව්‍යාපෘතිය අතර මග නවතා දැමුවහොත් මේ වන විට ඉදිකිරීම් කර ඇති කොටස් වෙනුවෙන් දරන ලද වියදම් නිෂ්පල වියදමක් වන අතරම මෙම ව්‍යාපෘතියේ බිම් මහල කඩ කාමර 18ක් සහිත බැවින් ඒ තුළින් සභාව අපේක්ෂා කල මූල්‍ය ශක්තියද අහිමි වනු ඇත. එසේම මෙයට ඇතුලත් මහජන පුස්තකාලය ද මහජනතාවට අහිමි වන බවත්, ඉහත වැඩ වටිනාකම් නිෂ්ප්‍රයෝජන වනවා මෙන්ම විගණන විමසුමකට පවා ලක් විය හැකි බවත් පෙන්වා දෙමි.

එබැවින් වරකාපොල නව නගරශාලා ගොඩනැගිල්ල අලුතින් ඉදිකිරිම 1 අදියර ව්‍යාපෘතියේ වැඩ නිමකිරීම සඳහා සකස් කල රු.55,000,000.00ක් වටිනා ඇස්තමේන්තුව පළාත් පාලන ඉංජිනේරුගේ සංශෝධනයන්ට හා පළාත් සභාවේ අනුමැතියට යටත්ව අනුමත කිරීමටත්, ඉදිකිරීම්වලට අදාල වියදම් ප්‍රාදේශීය සභා අරමුදලින් දැරීමටත්,

ඒ සඳහා

1.ස්ථාවර තැම්පත් ලෙස ඇති රු.18,800,000.00ක මුදලින් රු.15,000,000.00ක මුදලක් යොදා ගැනීම සහ ,

2.දැනට සති පොළ භූමියේ ඉදි කර ඇති කඩ කාමර වල ඉහල මහලයේ කඩ කාමර 06 දීර්ඝ කාලීන බදු දීමෙන් ලද ටෙන්ඩර් මුදලින් රු.5105,000.00 මුදලින් රු.5000,000.00 ලබා ගැනීම මඟින් රු.20,000,000.00ක මුදලක් සභා අරමුදලින් දැරීමටත්,

3.ඉතිරි මුදල සඳහා දේශීය ණය අරමුදලින් ලබා ගැනීම. (යෝජිත වරකාපොල ප්‍රාදේශීය සභා සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට අදාලව ණය ලබා ගැනිමට මූලික පියවර ගෙන ඇති ණය මුදල වරකාපොල නව නගරශාලා ගොඩනැගිල්ල අලුතින් ඉදිකිරීම 1 අදියර ව්‍යාපෘතිය සඳහා ලබා ගැනිමට කටයුතු කිරීම.)

4. බිම් මහලේ ඉදිකිරීමට යෝජිත කඩ කාමර Key –money ක්‍රමය යටතේ බදු දීමටත්, එම මුදල් ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගැනීමටත් සහ

5. රේඛීය අමාත්‍යාංශය වෙත යළි ඉල්ලීම් කර ප්‍රතිපාදන ලබා ගැනිම සුදුසු බවත්,

තවද සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සිදු කළ යුතුවන අතර ඒ සඳහා ප්‍රසම්පාදන දැන්වීම පුවත්පත් දැන්වීමකින් හා ප්‍රාදේශීය සභා වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරිම සුදුසු බවත් එම ක්‍රියාවලියට අදාල වියදම් හා ගාස්තු සභා අරමුදලින් දැරීම සුදුසු බවත් අපි මෙම ගරු සභාවට යෝජනා කරමු.

<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***ඒ අනුව මෙම හදිසි යෝජනාව තීරණ අංක ඉ- 18 යටතේ 2023.01.05 වන දින පැවති මහ සභාවේ ඒකමතිකව සභා සම්මත විය.***

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
මහ සභාව ටෙන්ඩර් මණ්ඩලයක් බවට පත් කිරීමට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.පී.කුමාර ඉලංගරත්න මැතිතුමා.</u>**
එම යෝජනාව ස්ථිර කරනවා.

**(ඊ) කාරක සභා අවස්ථාව - ටෙන්ඩර් මණ්ඩල වාර්තාව .**

**01.**

**වරකාපොල ප්‍රාදේශිය සභාවට අනුබද්ධ පෙර පාසල් සඳහා ත්‍යාග ලෙස කුඩ 107ක් මිලදී ගැනීම**

| විස්තරය | ට්‍රස්ට් බේබි කෙයාර්,කොළඹ පාර, වරකාපොල. (ඒකක මිල) | සමන් මල් වෙළඳ සැල,අංක 189, නුවර පාර, වරකාපොල (ඒකක මිල) | ගංගා පොත් හල, නො 121, කොළඹ පාර වරකාපොල (ඒකක මිල) |
|---|---|---|---|
| කුඩ (තුනට නවන) | - | රු.1400.00 | - |
| කුඩ (දෙකට නවන) | රු.1430.00 | රු.1390.00 | 1260.00 |

ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද **නො 121, කොළඹ පාර වරකාපොල, ගංගා පොත් හල** වෙතින් **වරකාපොල ප්‍රාදේශිය සභාවට අනුබද්ධ පෙරපාසල් සඳහා ත්‍යාග ලෙස කුඩ 107ක් මිලදී ගැනීමට** ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරණ ලදී.

02.

**වරකාපොල ප්‍රාදේශිය සභාවට අනුබද්ධ පෙරපාසල් දරුවන් සඳහා වර්ෂ අවසානයේ ලබා දෙන සහතික පත්‍ර මුද්‍රණය කර ගැනීම**

| විස්තරය | ආර්.පී.සෙලියුලර්, නො.154/ඒ,කෙළින්විදිය, වරකාපොල. (ඒකක මිල) | ලහිරු කමියුනිකේෂන්,නො,158,නුවර පාර, වරකාපොල.(ඒකක මිල) | A.S.E.කොම්පියුටර්, නො168,නුවර පාර, වරකාපොල. (ඒකක මිල) |
|---|---|---|---|
| සහතික පත් | රු.130.00 | රු.135.00 | රු.145.00 |

ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද **නො.154/ඒ, කෙළින්විදිය, වරකාපොල. ආර්.පී.සෙලියුලර්,** වෙතින් **වරකාපොල ප්‍රාදේශිය සභාවට අනුබද්ධ පෙරපාසල් දරුවන් සඳහා වර්ෂ අවසානයේ ලබා දෙන සහතික පත්‍ර මුද්‍රණය කර ගැනීමට** ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

03.

**වරකාපොල හෙළ බොජුන්හල සඳහා තීන්ත ලීටර් 10ක් මිලදි ගැනීම**

| වර්ගය | ඩී.ඩී.එස්.හාඩ්වෙයාර්,නො.85, අඟුරුවැල්ල පාර හොරගොල්ල , වරකාපොල | ඩී.ආර්.කේ.හාඩ්වෙයාර් සහ කන්ස්ට්‍රක්ෂන්, යුනිලැක් ගාමන්ට් අසල, ගණිතපුර, වරකාපොල. | විශාකා හාඩ්වෙයාර්, නො 42,අඟුරුවැල්ල පාර. වරකාපොල |
|---|---|---|---|
| එමෂල් තීන්ත 10L | රු.17200.00 | රු.15600.00 | රු.16300.00 |

ලැබූ මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද **යුනිලැක් ගාමන්ට් අසල, ගණිතපුර, වරකාපොල, ඩී.ආර්.කේ.හාඩ්වෙයාර් සහ කන්ස්ට්‍රක්ෂන්** වෙතින් **වරකාපොල හෙළ බොජුන්හල සඳහා තීන්ත ලීටර් 10ක් මිලදි ගැනීමට** ටෙන්ඩර් මන්ඩලය තීරණය කරන ලදී.

**ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.**

ටෙන්ඩර් මණ්ඩලය මහ සභාව බවට පත් කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී. මුහන්දිරම් මැතිතුමා</u>**
එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**
ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ අංක ඊ - 01 සිට ඊ-03 තෙක් නිර්දේශ මහ සභාව විසින් පිළිගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>**
එම යෝජනාව ස්ථිර කරනවා.

***ඉහත ටෙන්ඩර් මණ්ඩලය ගනු ලබන අංක ඊ-01 සිට ඊ-03 දක්වා නිර්දේශ 2023.01.05 මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.***

## උ-01

**<u>ඒකාබද්ධ ලැබීම්/ ගෙවීම් සාරාංශය</u>**

**<u>ගරු සභාපති එන්. සරත් සුමනසූරිය මැතිතුමා</u>**
2022 දෙසැම්බර මස ලැබීම් ගෙවීම් වාර්තාව පිළිගැනීම සුදුසු යැයි යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩබ්.බී.මුහන්දිරම් මැතිතුමා</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

***(2022 දෙසැම්බර් මස ලැබීම් ගෙවීම් වාර්තාව 2023.01.05 මහා සභාවේ තීරණ අංක උ-01 යටතේ ඒකමතිකව සභා සම්මත විය)***

**<u>වෙනත් කරුණු</u>**

**<u>එ 01-(1)</u>**

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා</u>**
අද දින මහා සභාවට නොපැමිණි නිවාඩු ලබා ගැනීමට ඉල්ලා ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම.**

| | |
|---|---|
| එස්.ඒ.ඉනෝකා ශ්‍යාමලී සමරවීර මැතිනිය | ගරු මන්ත්‍රී |
| ජී.ආර්.රේණුකා ගම්ලත් මැතිනිය | ගරු මන්ත්‍රී |
| එච්.එස්.සේනක ප්‍රියන්ත කුමාර මැතිතුමා | ගරු මන්ත්‍රී |
| එන්.ඩී.අකිල ප්‍රසාද් ජයරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |

**<u>ගරු මන්ත්‍රී ආර්.ආර්.එම්.පී.රාජකරුණා මැතිතුමා.</u>**
ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

වෛද්‍ය වාර්තා ලබා දීමේ වගකීම පිට තමයි මෙම නිවාඩු ලිපි අනුමත කරන්නේ.

***(ඒ අනුව මෙම යෝජනාව තීරණ අංක එ 01-(1) යටතේ 2023.01.05 වන දින පැවති මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.)***

**<u>එ 01-(11)</u>**

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ දිවංගත ඩඩ්ලි සේනානායක අගමැතිතුමා හතර වරක්ම දැදිගම ආසනයේ අගමැතිවරයා වශයෙන් සේවය කරපු ශ්‍රේෂ්ඨ නායකයෙක් ලෙසත්, ඒ වාගේම එතුමත් එක්ක හිටිය ධර්මසිරි සේනානායක මැතිතුමත් ඒ වාගේම ඒ කාල සීමාව තුළ තුල්හිරිය කාබුල් ලංකා මාස් ලංකා, වරකාපොල ආරෝග්‍ය ශාලාව, ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය වාගේම අපේ මේ බල ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා කාර්මික විද්‍යාලයක් විවෘත කළා වරකාපොල. ඩඩ්ලි සේනානායක කාර්මික විද්‍යාලය කියලා කාර්මික විද්‍යාලයක් නම් කරලා ඒ කාලයේ. ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ නම දැන් නැහැ. දැන් වරකාපොල කාර්මික විද්‍යාලය. ඩඩ්ලි සේනානායක අගමැතිතුමා, ධර්මසිරි සේනානානයක මැතිතුමා මෙම දැදිගම ආසනයට විශාල සේවාවක් කරපු නායකයෝ. ඒ දෙපළම තරග කළා දැදිගම ආසනයේ. වරකාපොල ආරෝග්‍ය ශාලාව, තුල්හිරිය, තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය, සෑම ගමක් පාසාම රෙදි පාසලක් තිබුණා. එදා අපේ දරුවෝ ජර්මන් ටෙක් යන්න කොළඹට යන්න ඕනේ. ඒ කාල සීමාවේ දූර දර්ශී නායකයෙක් ලෙස එතුමා ඩඩ්ලි සේනානායක කාර්මික විද්‍යාලය ආරම්භ කළා. අද හැමදාම මළගෙදරක් මගුල් ගෙදරකට යන විට මට කියනවා අනේ මන්ත්‍රීතුමා කතා කරලා කියන්න ඩඩ්ලි සේනානායක නම කැපුවේ කවුද කියලා. ඒ වාගේ ශ්‍රේෂ්ඨ නායකයෝ නම් කලාට පස්සේ ඩඩ්ලි සේනානායක කාර්මික විද්‍යාලය කියලා නම් කලාට පස්සේ දැන් නිකම්ම කාර්මික විද්‍යාලයක් බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ වගේ ශ්‍රේෂ්ඨ නායකයන්ගේ නම් කපා හරින එක මොන පක්ෂයක වුනත් සුදුසු නැති කාර්ය භාරයක් කියලා මම හිතනවා. ඒ නිසා මම නැවත වරක් සභාවෙන් හරි යෝජනාවක් දමලා ඒක ඩඩ්ලි සේනානායක කාර්මික විද්‍යාලය ලෙසට නම් කරන්න.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

විපක්ෂ නායකතුමා කල් දී ඇති යෝජනාවක් ලබන සභාවට ඉදිරිපත් කරන්න. අනුස්මරණ කරන්න කතා කරන අය හතර පාරක් අගමැති වුන ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ පිළිරුවක් හදා ගන්න බැරි වුනා. තරහා වෙන්න එපා කිව්වට. නිශ්ශංක විජේරත්න ඇමතිතුමාගෙන් පටන් අරගෙන මනෝ විජේරත්න ඇමතිතුමා, චම්පිකා ප්‍රේමදාස ඇමතිතුමා, දක්ෂ ප්‍රබල නායකයෝ මේ ආසනය නියෝජනය කලානේ. නමුත් ඩඩ්ලි සේනානායක ඇමතිතුමා හතර පාරක් අගමැති වුන ආසනයේ පිළිරුවක් හදා ගන්න බැරි වුණා . නමුත් සතුටු වෙන්න ඕනේ, ස්තුතිවන්ත වෙන්න ඕනේ කරුණාදාස ලෙනගල මන්ත්‍රීතුමාට. මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මැදිහත් වුනා මනෝ විජේරත්න මහත්තයාගේ පිළිරුවත් ඩඩ්ලි සේනානායක මහත්තයාගේ පිළිරුවත් කරන්න ඕනේ කියලා මම ආණ්ඩුකාර අනුමැතියට යවලා තිබෙනවා. නමුත් ඒක මට තාම ලබා ගන්න බැරි වුනා. ඒක ලබා ගත්ත වහාම අපි ඒක ආරම්භ කරලා කෙළෙහි ගුණ දක්වමු. මුහන්දිරම් මන්ත්‍රීතුමා අදටත් ධර්මසිරි සේනානායක ඇමතිතුමාට උපහාර පුද කරන්න මුලින්ම පටන් ගත්තේ ජයතිස්ස මහත්තයා. සභාවේ දීමනාව දුන්නා නමුත් පසුව එය අතහැරුනා. ඉන් පසු වර්ණසිරි මුහන්දිරම් මන්ත්‍රීතුමා ඇතුළු ගුවන් සේවා සමාගමේ අය සම්පූර්ණයෙන්ම බර කරට ගත්තා. සභාපතිවරයා ලෙස මමත් එතන නැහැ. උප සභාපතිතුමා හැදුවේ ධර්මසිරි සේනානායක ඇමතිතුමා. උප සභාපතිතුමත් එතන නැහැ. මාත් එතන නැහැ. වර්ණසිරි මුහන්දිරම් මන්ත්‍රීතුමා ඒ බර කරට ගත්තා. අරගෙන අද දානේ ටික දෙනවා. මට මතකයි ජයතිස්ස මහත්තයා ඉන්න කාලේ බණ්ඩාරනායක මහතාට දානයකුත් දුන්නා. එහෙම තමයි ඉතිහාසයේ දේවල් වෙනස් වෙලා යනවා. ස්තුතිවන්ත වෙන්න ඕනේ වර්ණසිරි මුහන්දිරම් මන්ත්‍රීතුමාට දැදිගම ආසනයේ මිනිස්සුන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කරලා ඒ වැඩ කිරීම පිළිබඳව. අපි දානයක් දෙමුකෝ ධර්මසිරි සේනානායක ඇමතිතුමාට, නිශ්ශංක විජේරත්න ඇමතිතුමාට, මනෝ විජේරත්න ඇමතිතුමාට පක්ෂ විපක්ෂ භේදයක් නැතුව එකතු වෙලා හොඳ වැඩක්.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.මොහොමඩ් ෂරීප් මැතිතුමා.</u>**

ඔබතුමා මේ කියපු කතාවට පිළිතුරක් වශයෙන් කියන්නේ. මේක ඩඩ්ලි සේනානායක පිළිරුව හදන්න රෝහල ඉදිරිපිට භූමියක් වෙන් කර ගත්තා. නමුත් එදා දේශපාලන අධිකාරිය කකුලෙන් ඇද්දා. ඔබතුමා කියනවා මෙච්චර කාලයක් හිටියා ඇයි මේක කර ගන්න බැරි වුනේ කියලා. නමුත් වාසනාවකට අපේ ප්‍රාදේශීය සභා භූමියක් තිබුණ නිසා තමයි එතන තියා ගන්න පුළුවන් කම ලැබුණේ. නමුත් මේකට අනුමැතිය ගත්තායින් පසුව කකුලෙන් ඇදීමක් වුවායින් පසුව තමයි මේක සිදු වුනේ.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

අපි වැඩේ කරමු.

**<u>ගරු මන්ත්‍රී ඩබ් රවිඳු ප්‍රභාත් සිං ජයරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමා මට විනාඩියක් දෙන්න ඔය සම්බන්ධයෙන් දැදිගම සංවර්ධන කමිටුවෙත් ඩඩ්ලි සේනානායක පිළිරුව හදන්න ගියා. නමුත් ධර්මසිරි සේනානායක පිළිරුව හැදුවා තිබ්බා දැන් පවත්වා ගෙනත් යනවා. ඔබතුමන්ලාත් හිටියේ යහපාලන ආණ්ඩුවේ .ඒවත් සාකච්ඡාවට බඳුන් වුණා. ඒවා ඔබතුමන්ලාගෙත් දුර්වල කම්. පොදුවේ ඩඩ්ලි සේනානායක මහත්තයට අපිත් ආදරය කරනවා, ගෞරව කරනවා.කාර්මික විද්‍යාලයෙන් නම ගිලිහී ගොස් තිබෙනවා නම් දේශපාලනයකින් තොරව නම ඇතුලත් කරන්න කියලා දේශපාලනයකින් තොරව මමත් ඉල්ලා සිටිනවා .වරකාපොල ප්‍රදේශයට රටේ ගොඩක් දරුවො මෙතනට එනවා.

**<u>ගරු සභාපති එන්.සරත් සුමනසූරිය මැතිතුමා.</u>**

අපි ඉස්සරලාම දානයක් දෙමු. අපේ න්‍යාය පත්‍රයට අනුව වැඩ කටයුතු අවසන් වෙනවා. තීරණාත්මක කාල පරිච්ඡේදයක් ගත කරන්නේ පළාත් පාලන ආයතන වල මන්ත්‍රීවරු හැටියට. ඉදිරියේදි අපට නාම යෝජනා ලබා දෙනවා ඒ පක්ෂ වලින්. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ හැටියට තින්දු කළා ලැයිස්තු සකස් කරන්නට. අනෙකුත් මන්ත්‍රීතුමන්ලා තම තමන්ගේ පක්ෂවල නාම යෝජනා සකස් කරනවා ඇති. අපි දන්නේ නැහැ අධිකරණමය ක්‍රියා මාර්ග මොන තත්වයට පත් වෙයිද කියා. කෙසේ වෙතත් අපි මැතිවරණයකට මුහුණ දෙන්න ඕනේ. ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ආරක්ෂා කර ගන්න නම් මැතිවරණයක් තියන්න ඕනේ. නමුත් මැතිවරණයක් තියන්නට තරම් සුදුසු ආර්ථික තත්වයක් තිබෙයිද කියා කාරණයක් තිබෙනවා. එතෙක් පළාත් පාලන ආයතනයේ කටයුතු අපි සුපුරුදු පරිදි කර ගෙන යනවා. අපේ සමහර මන්ත්‍රීවරු නිළධාරීන් ළඟට ඇවිත් සභාව විසිරෙනවා කිය කියා යනවා. කාට බලය ගියත් මහජන නියෝජිතයෝ පත් වෙන්න ඕනේ. පළාත් සභාව මහජන නියෝජිතයින් නැතුව මුදල් ඉතුරු කරලා තිබෙනවාද. දුරකතන දීමනාව හා මන්ත්‍රී දීමනාව ඉන්ධන දීමනාව ගන්නේ අපි එකතු කර ගන්නා සල්ලි වලින්. අපි හම්බ කරලයි මේවා අරගෙන තිබෙන්නේ. නමුත් මේක කවුරුත් කතා කරන්න යන්නේ නැහැ.ජ්‍යෙෂ්ට රජයේ නිළධාරීන් විධායක නිළධාරීන් විඳින වරප්‍රසාද අපේ මන්ත්‍රීවරු භුක්ති විඳින්නේ නැහැ. එයාලා සත පහක් වියදම් කරන්නේ නැහැ. කොමසාරිස් පාලනයකට ගිය විට තේරෙයි ඒක. මම ඉදිරියේදී පත් වන සභාපතිවරයාට 100%ක්ම උදවු කරනවා. නැත්නම් මේක අරගෙන යන්න බැහැ. මේ සභාව මන්ත්‍රී මණ්ඩලය නැතුව මාස 03ක් දිවුවොත් මම පුදුම වෙනවා. මම එනකොට කෝටියයි තිබුණේ. දැන් කෝටියයි අසුවක් තිබෙනවා. මේ වැඩ ඔක්කොම කරලත්. ආදායම් මාර්ග අනන්තවත් හදලා තිබෙනවා. නමුත් ලක්ෂ 58ක් මාසික වැය ප්‍රතිපූර්ය නොවන වැය. ඒ ලක්ෂ 58 පළාත් පාලන ආයතන විසින් හම්බ කරන්න ඕනේ. ඒ සල්ලි එන්නෙම නැහැනේ. හැමදාම මම උදේ ඇවිත් ගිණුමේ කීයද කියලා අහනවා. ඊයේ වන විට ලක්ෂ 20යි. සෑම වවුචරයකටම සල්ලි ගෙවන්න කියලා තිබෙන්නේ. ලක්ෂ 60ක් අවමව ගිණුමේ තියාගෙන යන්න ඕනේ අර්බුදයක් නැතුව පවත්වා ගෙන යාම සඳහා නම්. ඒ කියන්නේ වැටුප් ගෙවන්නම වෙනවා නේ. අනෙක් කාරණය තමයි විගණන කළමණාකරණ කමිටුව කෑගල්ලේ පැවැත්වූවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ හොඳම ආදායම් ප්‍රගතිය අපි. කවදා හරි තේරෙයි. එක කාලයක් කොමසාරිස් පාලනයකට ගිහිල්ලා සුභ සාධකයේ රුපියල් පහළොස් දාහ වෙනකම් බස්සලා ගියා. ඇවිල්ලා මම ඒ සල්ලි ඔක්කොම ගෙව්වා.දැන් ලක්ෂ හතරයි ගාණක් එකතු කරලා තිබෙනවා.විජේතුංග සභාපතිතුමා යන කොටත් ලක්ෂ හතරයි ගාණක් ගිණුමේ තියලයි ගියේ. මම සභාව භාර ගන්නා විට රුපියල් පහළොස් දහසයි තිබුනේ. විශ්‍රාම ගිය අයගේ මුදල් ගෙවන්නත් තිබුණා. ඒ මුදලුත් සියල්ලම ගෙව්වා. කොමසාරිස් පාලනයකට ගියොත් ඒක තේරෙයි. මම කියන්නේ කවුරු බලයට පත් වුනත් ප්‍රජාතන්ත්‍රවාදය අනුව කවුරු හෝ බලයට පත් වූ කණ්ඩායමක් එතන තිබෙන්නට ඕනේ. ඒ නිසා තමුන්නාන්සේලා සියලු දෙනාටම ප්‍රාර්ථනා කරනවා ඉදිරි

සභා වාරය තුළත් ඉදිරි සැසිවාරය තුළත් සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබෙන්න කියලා. මේ සැසිවාරය තමයි සභාව හැටියට වැඩියෙන්ම සතුටු වෙන්න පුළුවන් සභාවාරය. කාරණය පක්ෂ විපක්ෂ භේදයක් නැතුව අර්බුදයක් නැතුව මේ සභාව ඉස්සරහට ගියේ තමුන්නාන්සේලා දීපු විශ්වාසය මත. ඒ අනුව වැඩ කරලා අපි කරපු ගොඩාක් දේවල් තිබෙනවා .ඒවා ආරක්ෂා කර ගන්න නම් මේ කණ්ඩායම අතරින්ම සභාපතිවරයෙක් පත් වෙන්න ඕනේ. ඉදිරිය පිළිබඳව මට කියන්න තේරෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට වැටුප ගෙවන්න වෙන්නේ කමිටු සාකච්ඡාව දවසේ. ඊයේ මම උත්සාහ කලා අද දවසේ ගෙවන්නට. අවිනිශ්චිත තත්වය නිසා තමුන්නාන්සේලා අපහසුතාවයට පත් වන නිසා කමිටු සභාවාරයේදී වැටුප ගෙවන්න තීරණය කළා. මම සතුටු වෙනවා. මේ සැසිවාරය ඉතාමත් සතුටින් ගිය සැසිවාරයක්. ඉදිරි සැසිවාරය තුළ සියලු දෙනාටම මේ සභාව නියෝජනය කරන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ලැබුවා වූ නව වසර සියලු දෙනාගේම ප්‍රාර්ථනා ඉෂ්ඨ වන සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ස්තූතියි........................

සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව,

ලේකම්
වරකාපොල ප්‍රාදේශීය සභාව,